# මගේ ලෝකය

ඇසෙන දැනෙන දේ..
හිතට වැදෙන දේ..



ජගත් ජේ එදිරිසිංහ

## චරිතාපදාන

මම විවිධ පුද්ගලයන්ගේ චරිතාපදාන කියවන්නට මහත් රුචියක් දක්වන්නෙමි. ඩී බී කුරුප්පු ශූරීන් ගේ ''හැන්දෑවට පායන හිරු නොහොත් යුගයක අත්දැකීම්'' පොතත් ඩී එෆ් කාරියකරවන ශූරීන් ගේ ''දශක සතක මතක'' හා ''මතක පොතේ ඉතිරි හරිය'' පොත් දෙකත් පසුගිය මාස කීපයේ දී නැවත කියෙව්වෙමි. මේ දෙදෙනාම වියපත් ලේඛකයෝ ය. සාපේක්ෂ වශයෙන් තරුණ ලේඛකයකු වන ගුණසිරි සිල්වා සිය අත්දැකීම් ලියා තැබූ ''පිහාටු පෑන'' පොත කියෙව්වේ ගිය මාසයේ ය. ඔහුගේ පොතේ පෙරවදනේ එන මේ කොටස මගේ සිත් ගත්තේ ය.

*''හැම කෙනෙකුටම කියන්නට කතාවක් ඇත. හැම කතාවක්ම නිසි ලෙස පෙළ ගැස්විය හැකි නම් ඒ සියල්ල ම රසවත් වනු නොඅනුමාන ය. එහෙත් පාඨකයා හමුවට එන්නේ ලේඛකයන් කලාකරුවන් දේශපාලනඥයන් වැනි සිවිල් චරිත පිලිබඳ කතා පමණක් ම නිසා අර හැම දෙනා තුළම පොදුවේ පවතින රසවත් කතා නො-වැදගත් ඒවා ලෙස යටපත් වෙයි.''*

කුරුප්පු මහතා සිය ජීවිත කතාව ලියන්නේ මතකයෙනි. ඔහුට ඇති ස්මරණ ශක්තිය විශ්මයජනක ය. කුරුප්පු මහතාගේ වයසට එන තෙක් ජීවත් වන්නට ලැබුණොත් අපූරු ය. එහෙත් ඉතා දුර්වල ස්මරණ ශක්තියක් ඇති මගේ මතකය ගැන මට කිසිදු විශ්වාසයක් නැත. එනිසා ම මතකයට එන යම් යම් දේ ලියා තබන්නට මම සිතමි. එයින් යම් රසයක් විඳ ගන්නට එක් අයකුට හෝ හැකිවුව හොත් එය සතුටකි.


## සන්නස සාහිත්‍ය දිනය

සන්නස සාහිත්‍ය තරගාවලියේ සහතික බෙදා දීම නිමා විය. සුන්දර සැන්දෑවකින් පසු අප ආපසු ආවේ මහත් සතුටක් සිත්හි රඳවාගෙන ය. තරගයේ ජයග්‍රාහක කෙටි කතා දහය ඇතුළත් කොට පළමුවැනි තෑග්ග කෙටි කතා සංග්‍රහය නිකුත් කරන්නට ලැබීම අපේ සතුට තවත් වැඩි කරන්නට හේතු විය.

පොත මුද්‍රණය කිරීමේ කටයුත්තේ දී මට ශක්තියක්ව සිටියේ ඩී බී කුරුප්පු මහතා ය. එනිසාම මේ පොත ඔහුට පුදන්නට තීරණය කළෙමු. කුරුප්පු මහතා අනවශ්‍ය ගරු සැළකිලි වලට කැමති නැති නමුත් ඔහු ගේ කැමැත්ත නොවිමසා ම අපි මේ කටයුත්ත කළෙමු. ඒ අපේ හිතට හරියන මිනිසෙකුට පොත පිදිය යුතු නිසා-වෙනි.

පළමුවැනි තෑග්ග පොත තුසිත් අබේනායක සොයුරා අතින් කුරුප්පු මහතාට පිළිගැන්වෙන මොහොතේ මගේ සිත දුව ගියේ පොතක් පිලිගන්වන්නට ගොස් උගත් පළමු පාඩම වෙත ය. ඒ 70 දශකයේ අග භාගයේ දී ය.

එවකට කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයයේ උසස් පෙළ හදාරමින් සිටි මම විද්‍යා ශිෂ්‍ය සංගමයේ ලේකම් වරයා වූයෙමි. සභාපති වූයේ මගේ හිත මිතුරා උදය ලක්ෂ්මන් ය. (පසු කළෙක ලංකාවේ අති සාර්ථක ව්‍යාපාරිකයකු ව මහත් සැපවත් දිවියක් ගෙවමින් සිටි මගේ මිතුරා පූරුවේ කළ පවක් පළදීමෙන් දෝ නවසීලන්තයට සංක්‍රමණය වී දැන් සැපසේ දුක් විඳිමින් සිටියි. නරක කල ආ දා විශ්ණු දෙවින්යන-'ට ද බටකොල කන්නට වූ වා ලු. උදය ලක්ෂ්මන් ගේ හා මගේ කතා බොහෝ ය. ඒ සියල්ල පසුවට තබමි)



නම විද්‍යා ශිෂ්‍ය සංගමය වුව ද අප දෙදෙනා මේ සංගමයේ කළේ කලා කටයුතු ම ය. අපි පළමුව පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර සාහිත්‍ය තරගයක් පැවැත්වූයෙමු. අපේ ඊළඟ අරමුණ වූයේ සඟරාවක් මුද්‍රණය කිරීම ය.

60 දශකයේ 'විද්වාන්' නමින් මුද්‍රණය කර තිබූ සඟරාව පාසලේ මුල්ම මුද්‍රිත සඟරාව විය. දෙවැන්න වූ අපේ සඟරාව මම 'මුතුහර' ලෙස නම් කළෙමි. සොයා ගත හැකි සියලුම රාජ්‍ය ආයතන වලට ගොස් වෙළඳ දැන්වීම් එකතු කළෙමු. ඒ සඳහා අවසර දෙන ලෙස ඉල්ලා වෙළඳ අමාත්‍යාංශයට යැවූ ලිපියට පිළිතුරු එව්වේ එවකට වෙළඳ ඇමති වූ ටී බී ඉලංගරත්න මහතා මය. එතුමා සිය අස්සනින් ම නිකුත් කළ ලිපියකින් අපට ඒ සඳහා අවසර දුන්නේ ය. (ඒ කාලයේ ඇමතිවරු එහෙම ය)

මහත් වැර වෑයමක් දරා අපි අපූරු සඟරාවක් මුද්‍රණය කළෙමු. සඟරාව විදුහල්පති තුමාට පුදන්නට අපි තීරණය කළෙමු.

''ඒකාකාරී රටාවෙන් මිදී නව මං ඔස්සේ සිතන්නට අප මෙහෙයවන විදුහල්පති තුමාට බැතියෙන් පිදෙයි'' මේ මා ලියූ පිදීමේ පාඨයයි.

නියමිත දවසේ අපි විදුහල්පති තුමා හමු වී ඔහුට සඟරාව පුද කළෙමු. සඟරාව අතට ගෙන පිටුවක් දෙකක් පෙරළූ එතුමා කී වදන් මට තවමත් මතක ය.

''අයිෂේ ජගත්... ලස්සන වැඩක් කළාම ඒක අපි අපිටම පුදාගෙන ඇති වැඩේ මොකක් ද..? තමුසෙලා මේක මට පුදන්නෙ නැතිව අධ්‍යාපන ඇමති තුමාට පිදුවා නම් එහෙමත් නැත්නම් අඩුම ගානෙ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාට පිදුවා නම් ඒ අය ලව්වා ඉස්කෝලෙට මොකක් හරි වැඩක් කරවා ගන්න තිබුණා.. යමකට මහන්සි වුණාම ඒකෙන් උපරිම ප්‍රතිඵල එන විදිහට ඒක කරන්න ඕනෙ අයිෂෙ..''

විදුහල්පති තුමා එදා ඉගැන්නූ පාඩම මම කිසි දිනෙක අනුගමනය නොකළෙමි. අදත් අපේ පොත කුරුප්පු අංකල්ට පුදා මා ලැබූ අති මහත් සතුට වෙන කිසිදු පුද්ගලයෙකුට පුදා ලබන්නට නොහැකි බව මම සක් සුදක් සේ දනිමි. සතුට මිල කළ හැක්කේ කාට ද?

සාහිත්‍ය උළෙල නිමා කර පිටව යන්නට සැරසුණ මොහොතේ දෑස් කඳුළින් තෙමන කතාවක් කීවේ සන්නසේ අසෝක සුබසිංහ සොයුරා යි. ''උඹලා වගේ මිනිස්සු ඇසුරේ ඉන්න ලැබුණ එකත් වාසනාවක්...''

උඹට ස්තුතියි මිත්‍රයා.

## කතන්දර කියන ආච්චි අම්මලා

අපේ අම්මාගේ අම්මාට බාල සහෝදරියන් තිදෙනෙකි. එයින් එක් අයෙක් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබලයන් වූ නන්දිසේන කුරේ හා සිරිසේන කුරේ මහත්වරුන්ගේ අම්මා ය. අපේ තාත්තා බරපතල කොමියුනිස්ට් කාරයකු වූ බැවින් හා නන්දිසේන සිරිසේන මාමලා බරපතල යූඑන්පී කාරයන් වූ බැවින් දෝ ඒ පවුල සිටියේ කවදත් අපට ඈතිනි.

අපට ළඟින් සිටියේ අනිත් පුංචි ආච්චි ය. ඒ පුංචි ආච්චිත් අපේ ආච්චිත් අපූරු කතා කාරියෝ ය.


රෑ කෑමෙන් පසු අපි අපේ ආච්චිගේ ඇඳ අසළ බිම වාඩි වෙන්නෙමු. ගාස්තුව ලෙස නොවුණත් ඇය සතුටු කිරීම සඳහා බුලත් විටක් ද බුලත් වංගෙඩියේ දමා කොටා දෙන්නෙමු. බුලත් විටක් ද සපමින් අපේ ආච්චි අපට කතා කියා දෙන්නේ මහත් සතුටකිනි. මේ සඳහා ඈ අපෙන් බලාපොරොත්තු වූ එකම දෙය ඇගේ කතාව අප සාවධානව අසා සිටින බව හැඟවීම සඳහා 'හූම්' මිටි තැබීම පමණක් ය. අමතක වීමතින් හෝ 'හූම්' මිටි නොතැබුවහොත් ඇයට බොහෝ සේ තරහ යයි.

''අහගෙන ඉන්නෙ නැත්නං මං කතාව නවත්තනවා..'' ඈ පොඩි පහේ තර්ජනයක් ද දමයි.

අපේ ආච්චි අවුරුදු අසූ තුනක් ආයු වළඳා මිය ගියායින් පසුව කතන්දර කීමේ වාරය ගත්තේ පුංචි ආච්චි ය. යකුන් දෙවියන් පිරුණ සුරංගනා කතා ද ඇගේ ට්‍රන්ක පෙට්ටියේ ඇති මාරක කතා ද සිංහල හින්දි චිත්‍රපට කතා ද ඈ අපට කියන්නේ ඒ චරිත අප ඉදිරියේ ජීවමාන කරවමිනි.

වඩා වැදගත් දෙය අප කතා අසා රස විඳ සතුටු වූවා සේ ම අපට කතා කීමෙන් අපේ ආච්චිලා ද සතුටක් ලැබූ බව ය. වයසින් වැඩෙත්ම අපේ පරිකල්පනය දියුණු තියුණු කරන්නට අපේ ආච්චිලා කියූ කතා අඩිතාලම දැමුවා නොවේ දැයි දැනෙන විට සිතට ඇති වන්නේ මිය පරලොව ගිය ඒ උපාසිකාවන් දෙදෙනා ගැන අති මහත් ආදරයකි. ජීවත්ව සිටියදී පෙන්වන්නට නොහැකි වූ ආදරය අද අපි සිතින් ඔවුනට පුද කරමු.

අද අපේ දරුවන් ගැන මට ඇතිවන්නෙ මහත් වේදනාවකි. ඔවුනගේ ළමා ලෝකය රසවත් කරන්නට සුරංගනා කතා කියා දෙන්නට ආච්චිලා දැන් නැත. ඒ අඩුව පුරවාලන්නට රූපවාහිනී රූප පෙට්ටියට හෝ ජේ කේ රෝලින්ට හෝ හැකි වේ ද?




## මසුරන් කියමන්



ආචාර්ය තිස්ස අබේසේකර සෞන්දර්ය කලා විශ්ව විද්‍යාල උපාධි ප්‍රදානෝත්සවයේදී

තමන් විසින් සූත්‍රගත කරන ලද නීතිරීති හා නියමයන් ඉක්මවා යෑම මේ පොතේ ගුරුන් දකින්නේ වරදක් ලෙසිනි. ඔවුන් විසින් අරක්ගත් කෙෂ්ත්‍රය දූෂිත කිරීමක් ලෙසිනි. එබැවින් ඔවුන් විසින් තම පාලනයට නතුකරගත් ශාස්ත්‍රාලයන්, රාජ්‍ය ආයතනයන් සහ සිවිල් ප්‍රජාව තුළ ක්‍රියකාරීත්වයක් දරන සංවිධාන මගින් එවැනි කටයුතු නිර්දය ලෙස යටපත් කිරීමට නිරතුරු ව්‍යායාමයක යෙදෙති. රටක පොදු සිරිත සමඟ එක්ව ඉන් නිරන්තර අනුප්‍රාණය ලබමින් ඉදිරිය බැලිය යුතු නව ස්වරූපය හා ස්වභාවයන් දක්වමින් පරිණාමයට පත්විය යුතු කලා ශිල්ප තුළ අර්බුදයන් හටගන්නේ මේ පොතේ ගුරුන්ද ඔවුන්ගේ අණසකට සවන් දෙන දේශපාලනඥයන් හා පරිපාලකයන්ද නිසාය.

උපුටා ගැන්ම දිවයින ඉරිදා සංග්‍රහය